# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2019 ජූනි

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2019 ජූනි මාසයේ ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය 2.1%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. පසුගිය මැයි මාසයේ මතුපිට උද්ධමනය 3.5%ක් ලෙස වාර්තා විය. 2019 ජූනි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -1.3%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.4%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. 2018 ජූනි මාසයට සාපේක්ෂව, 2019 ජූනි මාසයේ පොල්, එළවළු සහ සහල්වල මිල අඩුවීම ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. එහෙත් 2018 ජූනි මාසයේ 2.5% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 0.3%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.3%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2019 මැයි මාසයේ 128.7ක් වූ දර්ශකාංකය 2019 ජූනි මාසයේ 129.2ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2019 ජූනි මාසයේ දර්ශකාංකය 0.5ක වැඩිවීමක් එනම් 0.4ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.37%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.05%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා අළුත් මාළු, ලොකුළුණු, අමු මිරිස්, රතුළුණු, සහල්, අර්තාපල්, දෙහි, කරවල, කිරිපිටි සහ කෙසෙල් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් එළවළු, පොල්, කුකුල් මස් සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2019 ජූනි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'ප්‍රවාහන' (ඉන්ධන මිල සහ ගුවන් ගමන් ගාස්තු), 'ආපනශාලා සහ හෝටල්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'රෙදිපිළි හා පාවහන්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (බුලත්) කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවී ඇත. තවද 'විවිධ භාණ්ඩ හා සේවා' කාණ්ඩයේ වියදම්වල වටිනාකම සුළු අඩුවීමක් වාර්තා වී ඇත. කෙසේ නමුත්, පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වෙනස් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යාමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය 2019 මැයි මාසයේ 6.3% සිට 2019 ජූනි මාසයේ 6.1%ක් දක්වා පහළ යාමක් වාර්තා විය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකය (මතුපිට) (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය**




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) |
| **2018** | ජුනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 |
| | අගෝ. | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 |
| | සැප්. | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 |
| | ඔක්. | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 |
| | නොවැ. | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 |
| | දෙසැ. | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 |
| **2019** | ජන. | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 |
| | පෙබ. | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 |
| | ජුනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 |